# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 05/06/2024 පැය 1930

## මාධ්‍ය නිවේදනය

### "සුවසාර කැදල්ල" ප්‍රජා පාදක පුනරුත්ථාපන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන වැඩසටහන - බස්නාහිර පළාත් උතුර දිසාව.

"සුවසාර කැදැල්ල"නමින් ආරම්භ කර පවත්වාගෙන යාමට නියමිත පුනරුත්ථාපන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන වලට අදාලව නියමු ව්‍යාපෘතිය බස්නාහිර පළාත් උතුර දිසාව කේන්ද්‍ර කොට ගනිමින් කැලණිය කොට්ඨාසයේ සමාරම්භක උත්සවය 2024.06.05 වන අද දින පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් මහබාගේ පරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

ඒ අනුව කැලණිය කොට්ඨාසයට අයත් පොලිස් වසම් වල මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයන් 60 දෙනෙකු අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සහභාගීත්වයෙන් සහ මාර්ගෝපදේශකත්වයෙන් දින 14 ක පුනරුත්ථාපන කටයුතු සඳහා යෙදවීමට සැලසුම් කර ඇත.

මෙම අවස්ථාව සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති ශාක්‍ය නානායක්කාර මහතා, බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහින්ද ගුණරත්න මහතා, නියෝජ්‍ය පොලිස්පති කපිල කඩුපිටිය මහතා, පුනරුත්ථාපන ලාභීන්ගේ භාරකරුවන් හා පොලිස් නිලධාරීන් රැසක් සහභාගී විය.

මෙම අවස්ථාවට සම්බන්ධ ඡායාරූප කිහිපයක් හා වීඩියෝ පටයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.










Keells



**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**